# ‘ගුරු ප්‍රතිභා ප්‍රභා’ ගුරු හා විදුහල්පති ඇගයීම - 2023(2024)

දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද වටිනාකම් ආරක්ෂා කරගනිමින් නිර්මාණාත්මකව කටයුතු කළ හැකි ශ්‍රී ලාංකික ප්‍රජාවක් බිහිකිරීම උදෙසා වර්තමාන අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීමෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සුවිශේෂී අවධානය යොමු වී ඇත.

මේ සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ නිර්මාණශීලී දායකත්වය තුළින් පාසල්වල පවතින අභියෝග ජයගැනීමට ක්‍රියාත්මක කරන ලද නවමු වැඩසටහන් “විශිෂ්ට ව්‍යවහාර” ලෙසින් පාසල් පද්ධතිය තුළ හඳුනාගත හැකි වේ.

ලෝක ගුරු දින සැමරුම් උලෙළට සමගාමී ව මෙම විශිෂ්ට ව්‍යවහාර පදනම් කර ගනිමින් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සිදු කරනු ලබන සම්මානනීය මෙහෙවර ඇගයීමට ලක් කිරීමට “ගුරු ප්‍රතිභා ප්‍රභා” සම්මාන ප්‍රදානෝත්සවය 2024 වසරේදී ද පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු සැලසුම් කර ඇත.

ඒ අනුව පහත සඳහන් විධිවිධාන සහ නිර්ණායකවලට අනුකූලව ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් තෝරා ගෙන ඇගයීමට ලක් කිරීමට අපේක්ෂිත ය.

**1.අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මූලික සුදුසුකම් පහත පරිදි වේ.**

1.1 ශ්‍රී ලංකා ගුරු සේවය / ශ්‍රී ලංකා විදුහල්පති සේවය /ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය යන සේවා යටතේ පාසල්වල සේවය කරන නිලධාරීන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

1.2 අයදුම්කරුවන් විදුහල්පතිවරයකු / නියෝජ්‍ය විදුහල්පතිවරයකු / සහකාර විදුහල්පතිවරයකු / ගුරුවරයකු ලෙස 2023.01.01 වන දිනට වසර 3ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය. (අඛණ්ඩ සේවා කාලය ලෙස සලකනු ලබන්නේ මෙම දිනට ආසන්න වසර 03 තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොතිබීම ය.)

1.3 සේවා කාලය තුළ විනය විමර්ශන නොමැති වීම. (ළමා අපයෝජන සම්බන්ධ විධිමත් විනය පරීක්ෂණයකින් වරදකරුවකු විම / ළමා අපයෝජනයකට අදාළ මූලික විමර්ශනයක් පැවැත් වීම / සාපරාධී වරදකට අදාළ ව උසාවියකින් වරදකරුවෙකු වීම / සාපරාධී වරදකට අදාළ ව නඩු පවරා තිබීම / ආසන්න වසර 5ක් තුළ විධිමත් විනය පරීක්ෂණයකින් වරදකරුවකු වීම / චෝදනා පත්‍රයක් නිකුත් කර තිබීම)

1.4 ආසන්න වසර පහක් තුළ කාර්යසාධනයේ ප්‍රමාණනය සතුටුදායක / ඊට ඉහළ ලබා තිබීම.

1.5 අයදුම්පත් තනිව හෝ කණ්ඩායමක් ලෙස හෝ ඉදිරිපත් කළ හැකි ය. කණ්ඩායමක් විසින් ක්‍රියාත්මත කරන ලද විශිෂ්ට ව්‍යවහාරයක් සඳහා ඍජුව ම දායකත්වය සපයන ලද අයගෙන් ඇගයීම සඳහා ඉදිරිපත් විය හැකි උපරිම සාමාජිකයින් සංඛ්‍යාව 05කට සීමා විය යුතු ය.

1.6 ඇගයීමේ දී කණ්ඩායමේ එක් එක් අයගේ දායකත්වය වෙන වෙනම සාක්ෂ්‍ය සහිත ව තහවුරු කළ යුතු ය.

1.7 වෙනත් සේවාවලට අයත් නිලධාරීන් ( උදා - සංවර්ධන නිලධාරී, රාජ්‍ය කළමනාකරණ සහකාර...) ඇගයීම් කණ්ඩායමට ඇතුළත් කළ නොහැකි ය.

- **අයදුම්කරු හෝ අයදුම්කරන කණ්ඩායමේ කණ්ඩායමක සියලුම සාමාජිකයන් ඉහත අංක 1.1 සිට 1.7 දක්වා වූ සුදුසුකම් <u>සියල්ල</u> සපුරා තිබිය යුතුය. එසේ නොවන අයදුම්පත් ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.**

## 2. නිර්ණායක

2.1 විශිෂ්ට ව්‍යවහාර ඇගයීම නිර්ණායක 2ක් යටතේ සිදු කරනු ලැබේ.

2.2 මූලික නිර්ණායක - කලාප මට්ටමේ දී ලකුණු ලබා දෙනු ලැබේ.

2.3 විශිෂ්ට ව්‍යවහාර ඇගයීම සඳහා නිර්ණායක - කලාප, පළාත් හා ජාතික මට්ටමේ දී ලකුණු ලබා දෙනු ලැබේ.

2.4 2023.01.01 සිට 2023.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද විශිෂ්ට ව්‍යවහාරයක් විම.

2.5 පෙර වසරවල දී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරන ලද ගුරු ප්‍රතිභා ප්‍රභා වැඩසටහනක දී හෝ වෙනත් ඇගයීම් වැඩසටහනක දී හෝ ඇගයීමට ලක් නොවූ විශිෂ්ට ව්‍යවහාරයක් වීම.

2.6 පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රියාත්මක කරන ලද නිර්මාණශීලී විශිෂ්ට ව්‍යවහාරයක් වීම.

2.6.1 ශිෂ්‍ය සාධනය (ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා ලබා දී ඇති දායකත්වය)

2.6.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ඇගයීම (ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය)

2.6.3 විධිමත් විෂයමාලා කළමනාකරණය

2.6.4 විෂය සමගාමී කටයුතු (විෂය සමගාමී කටයුතු සඳහා සුවිශේෂ දායකත්වය)

2.6.5 ගුරු හා ශිෂ්‍ය සුබසාධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

2.6.6 නායකත්වය හා කළමනාකරණය

2.6.7 භෞතික සම්පත් කළමනාකරණය

2.6.8 පාසල් හා ප්‍රජාව (යහපත් අන්තර්පුද්ගල සබඳතා)

## 3. අයදුම්පත් ඉදිරිපත් කිරීම

3.1 පහත සඳහන් ක්‍රමවේද අතරින් එක් ක්‍රමවේදයකට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3.1.1 නිර්දේශ මත (පළාත් / කලාප නිලධාරීන්ගේ / පාසල් කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත)

3.1.2 ස්වයං ව (අයදුම්කරු විසින් ම)

3.2 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ <u>අවසාන දිනය **2024.07.12** වේ</u>.

3.3 අයදුම්කරුවන් විසින් මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව සකස් කළ අයදුම්පත සම්පූර්ණ කර විදුහල්පති මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. විදුහල්පති අයදුම්කරුවකු ලෙස ඉදිරිපත් වන්නේ නම් අයදුම්පත කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.4 අයදුම්පත සමග ඇමුණුම 1 හි ආකෘතිය අනුව සකසා ගත් ව්‍යාපෘති වාර්තාව ද කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ / විදුහල්පති අනුමැතිය සහිත ව ඉදිරිපත් කළ යුතු ය.

3.5 වාර්තාවේ උපරිම වචන සංඛ්‍යාව 200ත් – 500ත් අතර විය යුතු අතර එම වාර්තාව පැහැදිලි අත් අකුරින් ලියා හෝ පරිගණක ගත කර හෝ තිබිය යුතුය .

3.6 **අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයට පමණක් වන අතර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සෘජු ව අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු ය.**

## 4. ඇගයීම් ක්‍රමවේදය

4.1 විශිෂ්ට ව්‍යවහාර ඉදිරිපත් කිරීම

4.1.1 ඇගයීම් මණ්ඩලය ඉදිරියේ ඔබගේ විශිෂ්ට ව්‍යවහාරය, උපරිම කදා (Slides) 10ක විද්‍යුත් සමර්පණයක් (Presentation) මගින් ඉදිරිපත් කළ යුතු අතර එහි දෘඪ පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

4.1.2 ඉදිරිපත් කිරීමේ කාලය මිනිත්තු 10කි.

4.1.3 විද්‍යුත් සමර්පණයේ (Presentation) අඩංගු විය යුතු කරුණු.

4.1.3.1 පාසලේ කුමන අවශ්‍යතාවක් සම්පූර්ණ කර ගැනීම සඳහා සිදු කළ ක්‍රියාකාරකමක් / වැඩසටහනක් ද යන්න හැඳින්විය යුතුයි. (ගැටලුව කෙටියෙන් හැඳින්වීම)

4.1.3.2 එම ක්‍රියාකාරකම / වැඩසටහන ක්‍රියාත්මක කළ ආකාරය.(ක්‍රමවේදය)

4.1.3.3 පාසලේ පවත්නා සම්පත් / පහසුකම් උපරිම වශයෙන් යොදා ගත් ආකාරය දැක්විය යුතුයි.

4.1.3.4 ව්‍යවහාරය ක්‍රියාත්මක කිරීම තුළින් ලබාගත් ප්‍රතිලාභ හා ඒ බව සෘජුව ප්‍රතිලාභීන්ගෙන් නිරීක්ෂණය කළ හැකි වීම. (සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි)

4.1.3.5 ව්‍යවහාරය පාසල තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කරන / කළ හැකි ආකාරය.

4.1.3.6 සෙසු පාසල්වලට ආදර්ශයක් සැපයිය හැකි, ජාතික / ජාත්‍යන්තර මට්ටමට හඳුන්වා දිය හැකි ව්‍යවහාරයක් විය යුතුයි.

### 4.2 ඇගයීම් සිදුකරන කාල සීමාව

| | |
|---|---|
| කලාප මට්ටමේ ඇගයීම | 2024.07.15 සිට 2024.07.30 තෙක් |
| පළාත් මට්ටමේ ඇගයීම | 2024.08.07 සිට 2024.08.23 තෙක් |
| ජාතික මට්ටමේ ඇගයීම | 2024.09.02 සිට 2024.09.13 තෙක් |

### 4.3 කලාප මට්ටමින් ඇගයීම

4.3.1 කලාප මට්ටමේ ඇගයීම් කමිටුව සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාපයේ අධ්‍යාපන සංවර්ධන භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ සභාපතිත්වයෙන් යුතුව තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු ය.

4.3.2 එම කමිටුව මගින් පාසල් මට්ටමින් ලැබී ඇති අයදුම්පත්වල ට අදාළ ඇගයීම් කටයුතු සිදු කළ යුතු අතර ඒ සඳහා ඇමුණුම 2හි ලකුණු පටිපාටිය අනුව ඇමුණුම 3 ඇගයීම් පත්‍රිකාව භාවිතය කළ යුතු ය.

4.3.3 කලාපයෙන් ඉහළ ම ලකුණු ලබා ගත් විශිෂ්ට ව්‍යවහාර 03ට අදාළ නාම ලේඛනය (ඇමුණුම 4(i) අනුව), අයදුම්පත් හා ඇගයීම් පත්‍රිකා ද ඇතුළත්ව කවරයක බහා මුද්‍රා තබා අධ්‍යාපන කලාපය පැහැදිලිව සඳහන් කර **2024.08.05** දින / ඊට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

### 4.4 පළාත් මට්ටමේ ඇගයීම

4.4.1 පළාත් මට්ටමේ ඇගයීම් කමිටුව සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාතේ අධ්‍යාපන සංවර්ධන භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ සභාපතිත්වයෙන් යුත් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු ය.

4.4.2 කමිටුව මගින් කලාප මට්ටමින් ලැබී ඇති අයදුම්පත්වලට අදාළව පළාත් මට්ටමේ ඇගයීම් කටයුතු ඇමුණුම 2 හි ලකුණු පටිපාටිය අනුව ඇමුණුම 3 හි ඇගයීම් පත්‍රිකාව භාවිත කර සිදු කළ යුතු ය.

4.4.3 පළාතෙන් ඉහළ ම ලකුණු ලබා ගත් විශිෂ්ට ව්‍යවහාර 08 ට අදාළ නාම ලේඛනය (ඇමුණුම 4(ii) අනුව), අයදුම්පත් හා ඇගයීම් පත්‍රිකා ද ඇතුළත් ව කවරයක බහා මුද්‍රා තබා පළාතේ නම පැහැදිලිව සඳහන් කර **2024.08.28** දින / ඊට ප්‍රථම අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (කළමනාකරණ හා ප්‍රමිති) වෙත යොමු කළ යුතු ය.

### 4.5 ජාතික මට්ටමේ ඇගයීම

4.5.1 ජාතික මට්ටමේ ඇගයීම් කමිටුව සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ (කළමනාකරණ හා ප්‍රමිති) ඇතුළත් වන සේ පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබේ.

4.5.2 එම කමිටුව මගින් පළාත් මට්ටමින් ලැබී ඇති අයදුම්පත්වලට අදාළව ජාතික මට්ටමේ ඇගයීම් කටයුතු ඇමුණුම 2 හි ලකුණු පටිපාටිය අනුව ඇමුණුම 3 ඇගයීම් පත්‍රිකාව භාවිත කරනු ලැබේ.

4.5.3 ජාතික මට්ටමේ ඇගයුම්ලාභීන් තෝරා ගැනීමේ කමිටුවේ නිර්දේශ මත අධ්‍යාපන ලේකම් විසින් අවසාන තීරණය ගනු ලැබේ.